සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

**සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II**
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය:** ........................................

නිවැරදි බවට සහතික කරමි.

........................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**උපදෙස්:**

- I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.
- I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය. **මේ සඳහා සපයා ඇති ඉඩකඩ පමණක් භාවිත කරන්න.**
- II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.
- I පත්‍රය සඳහා ලකුණු **40**ක් ද II පත්‍රය සඳහා ලකුණු **60**ක් ද හිමි වේ.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

**I පත්‍රය**

| ප්‍රශ්න අංක | | ලකුණු |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

| | |
|---|---|
| ....................<br>පළමුවන පරීක්ෂක | ....................<br>සංකේත අංකය |
| ....................<br>දෙවන පරීක්ෂක | ....................<br>සංකේත අංකය |
| ....................<br>ගණිත පරීක්ෂක | ....................<br>සංකේත අංකය |
| ....................<br>ප්‍රධාන පරීක්ෂක | ....................<br>සංකේත අංකය |

[දෙවැනි පිටුව බලන්න.

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "දේවිනි එක්කෙනෙකුන් තබා දරුවන් දෙදෙනෙකු දෙමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

.....................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....................................................................................................

(ii) "තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

.....................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....................................................................................................

(iii) "අනේ කවුද දන්නේ සමහරු කියන්නේ සන්නිපාත උණෙයි කියලා"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

.....................................................................................................

(iv) **දියනෙත** උදාවත සිය කිරණින් මහරු
**මෙදියත** දිවා බිහි දුරුවෙයි ගන අඳුරු
සිරිමත රජතුමකු දුටු පමණින් සොඳුරු
ඇතුළත පිටත දිව රෑ හැරෙය දුක'ඳුරු

(අ) මෙහි අවසන් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**දියනෙත** ..............................................................................

**මෙදියත** ..............................................................................

(v) මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතර වන වාසනා

මගක් නම්
ඒ මගක් ම යි
නොමගක් නොවෙයි
මග නවතිනා

(අ) මෙම පැදි පෙළේ රචකයාගේ නම ලියන්න.

..............................................................................

(ආ) 'මොහොතක ඉසිඹු ලබනා විනා, නැත අතරමග නතර වන වාසනා' යන්නෙන් මතු කෙරෙන අර්ථය ලියන්න.

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

(ලකුණු 04 × 5 = 20යි) 20

**2.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

"මෙසේ බුදුන් දෙව්රම්හි වසන කලට ආයුෂ්මත් වූ නන්ද තෙරුන් වහන්සේ බැඳැවත් බිසොවුන් කියා ලූ බස් නමැති වයිති පෙම් නමැති දිවුළු ලා මුසු කොට, සිත් නමැති බිතත ඇඳලූ හෙයින්, ඒ බලා ශාසනයෙහි උකටලීව, 'මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිම්'යි හිතමිත්‍ර වහන්දෑට කී සේක. බුදුහු ඒ පවත් අසා නන්ද මහතෙරුන් වහන්සේ කැඳවාලා 'සැබෑ ද නන්දයෙනි, භික්ෂූන්ට මෙබන්දක් කිවුදැ'යි විචාරා වදාරා 'සැබව ස්වාමීනී'යි උන් වහන්සේ කී කල්හි 'නන්දයෙනි, සිවුරු හරණේ කුමක් නිසා දැ'යි විචාරා වදාළ සේක. එසේ විචාරා වදාළ බුදුන්ට 'ස්වාමීනි, මා මහණවන්ට සිතින් නොසිතින් එන ගමනේ දනවුකලණ බිසවු සෝධාපූ හිසකේ හිණි නො ගන්නා තෙක් අවුත් 'වහා අව මැනැවැ'යි යන බසක් කිවූ ය. මම ඒ බස එක් වන් සඳහන් කරන්නෙම් මෙබන්දක් සිතම්'යි කී සේක.

එකල බුදුහු තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්හිඳුවන කලක් මෙන් ඔබගේ එබඳු අනුභාවයක් නැතත් තමන් වහන්සේගේ අනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව්ලොවට වඩනා සේක් අතුරුමඟ නවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැදිරිමැල්ලක මවාලා තවුතිසා දෙව් ලොවට වැඩ සක්දෙවිඳුහුගේ පන් සියයක් පමණ දෙවඟනන් පෑලා 'කුමක් ද නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තු දැ'යි විචාළ සේක.

(i) මෙම පාඨයෙහි ඇතුළත් උපමාවක් උපුටා ලියන්න.

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 04යි)

(ii) "අතුරු මඟ නවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැදිරිමැල්ලක මවාලා" මෙම පාඨයෙහි අර්ථය ලියන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 04යි)

(iii) නන්ද තෙරුන් වහන්සේ සිවුරු හැරීමට තීරණය කළ හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 06යි)

(iv) නන්ද තෙරුන් සිවුරු හැර යාම වළක්වනු පිණිස බුදුන් වහන්සේ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 06යි)

20

**නැතහොත්**

පෙරදිග ගොරහැඬි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුලු හෙලනවා.

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයටම.

(i) ''පෙරදිග ගොරහැඬි රකුසෝ'' යනුවෙන් කවියා ආමන්ත්‍රණය කරන්නේ කාහට ද?

.............................................................................................................. (ලකුණු 04යි)

(ii) ''මල් පොහොට්ටු තිගැස්සිලා කඳුලු සලනවා'' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 04යි)

(iii) කවි පන්තියේ සඳහන් පරිදි කවියාගේ නින්දට සිදු වූ බාධා **දෙකක්** ලියන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 06යි)

(iv) සුලබ අත්දැකීමක් දෙස කවියා හෙළන අපූර්ව දෘෂ්ටිය පිළිබඳ ඇගයීමක් කරන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 06යි)

20

**

iruonline.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ-නැගී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු-වැව්-පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙ'ව් පවතිත් නිතින්

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබ'ඨ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

- මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
- එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
- මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
- සමාජයේ විවිධ පුද්ගල චර්යා නිරූපණය කිරීමට කවියා ගෙන ඇති උත්සාහය
- මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු (ලකුණු 06 × 5 = 30යි)

[අවවැනි පිටුව බලන්න.

**2.** ළමා සිතුම් පැතුම් සහ ගති පැවතුම් නිරූපණයෙහි ලා 'වෙසක් පහන' කෙටිකතාවේ රචකයා දැක්වූ සමත්කම නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

**3.** 'අලුත ගෙනා මනාලිය' පද්‍ය පන්තියේ දී මනාලියකගේ චර්යා මැනවින් නිරූපණය කිරීමට කවියා සමත් වී ඇති ආකාරය නිදසුන් **තුනක්වත්** භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

**4.** ''තමන් හැර ගිය පබාවතියගේ සිත දිනා ගැනීමට කුස කුමාරයා ගත් උත්සාහය කුස ජාතකයෙන් මැනවින් නිරූපණය වේ.'' නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

**5.** උචිත පද, සංකල්ප රූප සහ රිද්මය භාවිතය 'වැස්ස' පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය නිදසුන් **තුනක්වත්** ආශ්‍රයෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15යි)

* * *

iruonline.com